# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 1924/29 - 2015 ජූලි මස 22 වැනි බදාදා - 2015.07.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/15/13/2011

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.09.06 දිනැති හා අංක 1826/37 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.08.23 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කඩවත, කිරිල්ලවල, අංක 5/30 හි පදිංචි ඒ. එම්. එන්. ඒ. ඩී. රෝහිත ප්‍රේමලාල් මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2015.03.31 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,<br>
කම්කරු කොමසාරිස්.

2015 ජූලි මස 07 වැනි දින,<br>
කම්කරු දෙපාර්තමේන්තුව,<br>
කොළඹ 05.

යොමු අංකය : IR/15/13/2011

**කාර්මික අධිකරණයේ දී ය.**

ඒ. එම්. එන්. ඒ. ඩී. රෝහිත ප්‍රේමලාල් මයා,<br>
අංක : 5/30,<br>
කිරිල්ලවල, කඩවත.

- පළමු පාර්ශ්වය-

නඩු අංකය : ඒ/3520 එරෙහිව

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,<br>
අංක : 500, ටී. බී. ජයා මාවත,<br>
කොළඹ 10.

- දෙවන පාර්ශ්වය-

**ප්‍රදානය**

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා ) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2013.08.23 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුල මෙසේය.

"01. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්මික නිලධාරී I වන ශ්‍රේණියේ සේවය කරන ඒ. එම්. එන්. ඒ. ඩී. රෝහිත ප්‍රේමලාල් මහතාව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 2000.09.30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි කාර්මික


1 A – G 21981 — 42 (2015/07)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නිලධාරි I වන ශ්‍රේණියට උසස් නොකිරීම යුක්ති සහගතව ද යන්න හා නොඑසේ නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳව සහ

2. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ඒ. එම්. එන්. ඒ. ඩී. රෝහිත ප්‍රේමලාල් මහතාට 2006 වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි කාර්මික නිලධාරි විශේෂ ශ්‍රේණිය ලබා නොදීම යුක්ති සහගත ද යන්න හා නොඑසේ නම් ඔහුට කුමන සහනයන් හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ."

මෙම යොමුව පිළිබඳව ප්‍රථමයෙන්ම කාර්මික ආරවුල් පනතේ 39 වන වගන්තිය ප්‍රකාරව අනුමත කරන ලද නියෝග යටතේ 1961.10.27 වැනි දිනැති අංක 12731 දරන ගැසට් පත්‍රයට සාරානුකූලව එහි 30 වන වගන්තිය ප්‍රකාරව පාර්ශ්වයන්ට ඔවුනොවුන්ගේ කරුණු දක්වන ලෙසට ඉඩකඩ සලසා දීමෙන් අනතුරුව පාර්ශ්වයන් අතර පවත්නා ගැටලුව සම්බන්ධව සමථයකින් ආරවුල විසඳාලීමට ගත් ප්‍රයත්න අසාර්ථක වීමෙන් අනතුරුව අදළ කරුණ විභාගයට ගැනීමට තීරණය විය.

ඒ අනුව 2014.05.12 වැනි දින ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් නියෝජිත ග්‍රේෂන් ද සිල්වා මහතා සහ වග උත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් එහි අධ්‍යක්ෂිකා නීති ආර්. එල්. රාජපක්ෂ මහත්මියගේ පෙනී සිටීම මත මෙම විභාගය ආරම්භ කරන ලදී.

ප්‍රථමයෙන් ඉල්ලුම්කරු සිය නඩුව ඉදිරිපත් කරමින් තමන් වග උත්තරකරුගේ 3 වන ශ්‍රේණියේ කාර්මික නිලධාරියෙකු ලෙස 1985.07.20 වැනි දින බැඳුණු බවත්, ඒ සඳහා 1985.10.12 වැනි දිනැති පත්වීම් ලිපිය ඒ/01 ලෙස සලකුණු කරමින් කියා සිටියේය. තවද 1996 වසරේ නව ශ්‍රේණිය සංශෝධනය වීමෙන් අනතුරුව III වෙනි ශ්‍රේණියේ කාර්මික නිලධාරි තනතුරට පත්ව සිටියදී කාර්මික නිලධාරි II (අ) තනතුරට උසස්වීම් ලැබූ බවත්, ඉන් පසුව තමාට ලැබිය යුතු පළමු ශ්‍රේණිය බවත්, ප්‍රකාශ කර සිටියේය. එම ශ්‍රේණිය වර්ෂ 2000.09.30 වැනි දින වන විට ලබා ගැනීමට තමා සුදුසුකම් සපුරා සිටි බවද, 2006 සැප්තැම්බර් වන විට තමාට කාර්මික නිලධාරි විශේෂ ශ්‍රේණිය ලැබිය යුතු වුවද, එදිනට එය තමාට ලබා නොදුන් බවද සාක්ෂාත් කළේය.

එහෙත් කාර්මික නිලධාරි I ශ්‍රේණිය ප්‍රමාද වී එනම්, 2005.09.30 වැනි දිනට ලැබූ බවත්, 2009.09.31 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එය ලබා දී තිබූ බවත්, A/03 දරන පත්වීම් ලිපිය ඉදිරිපත් කරමින් කියා සිටියේය. 2009.09.31 වැනි දින සිට ක්‍රියාත්මකව පැවති I ශ්‍රේණිය ක්‍රියාත්මක විය යුතු දිනය විය යුත්තේ 2000.09.30 වැනි දින සිට බවද සාක්ෂිකරු හෙළි කළේය.

එකී උසස්වීම වසර 05කින් ප්‍රමාද වීම හේතු කොට ගෙන තමාට පහත සඳහන් පරිදි අගතියක් සිදු වූ බවද, නම් :-

(i) වැටුප් වැඩිවීම අහිමි වීම
(ii) ක්ෂේත්‍ර දීමනා අනුපාතය අඩුවීම
(iii) ක්ෂේත්‍ර නිලධාරින් ලෙස සේවය කිරීමේ දී නිවාඩු දින වැඩ කිරීමේ දී දීමනාවන් අඩුව ලැබීම
(iv) කළමනාකරණ සේවයේ පළපුරුද්ද අඩුවීම
(v) අනිකුත් උසස්වීම් සඳහා අයදුම් කිරීමේදී සේවා කාලය සම්පූර්ණ කිරීමට නොහැකි වීම
(vi) අර්ථ සාධක හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් ගණනය කිරීමේදී අඩුවක් සිදුවීම.
(vii) මාසිකව රු. 4000 ක මුදලක් අඩුවෙන් ලැබීම නිසා මූල්‍යමය හානියක් සිදුවීම ආදිය වේ.

මෙම හේතු සියල්ලම හානි පූරණය කරවා ගැනීම් වස් නියමිත දිනයන්හි සේවයේ පිහිටුවීමත්, හිඟ වැටුප් සහ දීමනා ලබා දෙන ලෙසත්, අර්ථ සාධක හා භාර අරමුදල් යථෝක්ත ගිණුම්වල බැර කරන ලෙසත්, ඉල්ලා සිටින බැව් ඉල්ලුම්කරු සිය සාක්ෂිය ඉදිරිපත් කරමින් කියා සිටියේය.

ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න නගන වගඋත්තරකරුගේ නීති නිලධාරිනිය මෙම ඉල්ලුම්කරු මුහුණ පා ඇති ප්‍රශ්න ආයතනයේ තවත් නිලධාරීන්ට පවතී දැයි ප්‍රශ්න කල අතර, ඒ බැව් තමන් නොදන්නා බවත්, තම ආයතනයේ තමා හා සේවයේ යෙදෙන වෙනත් 100,150ක් පමණ වන අනිකුත් සමාන්තර නිලධාරීන්ට ද ප්‍රශ්න තිබෙන්නට ඉඩ ඇතත්, තමා බේරුම්කරණය ඉදිරියට පැමිණියේ තමන්ගේ වෘත්තීය සම්බන්ධ ප්‍රශ්න විසඳා ගැනීමට බවත් ප්‍රකාශ කළේය.

වැඩිදුරටත් හරස් ප්‍රශ්න සඳහා පිළිතුරු දෙන ඉල්ලුම්කරු, තමාගේ පත්වීම් ලිපියේ 9 ඡේදය සිහිගන්වමින් "මහවැලි අධිකාරියේ සහ නිර්මාණ ඒජන්සිය විසින් දනට පනවා ඇති නීතිරීති රෙගුලාසිවලට යටත් විය යුතුය" යන වගන්තිය අනුව ඉල්ලුම්කරු යටත් විය යුතු නොවේදැයි වගඋත්තරකරු ප්‍රශ්න කලෙන්, එකී අළුත් නීතිරීති එක් වූ බව පිළිගනු ලබන්නේ 2013.06.12 වෙනි දිනෙන් පසුව පනවන ලද නියෝග මත බැව් ප්‍රකාශ කළේය.

ඉල්ලුම්කරු මුහුණ පා ඇති නොවිසඳුණු ප්‍රශ්න ඔහුට පමණක් ආවේනික නොවූ ප්‍රශ්න බවත්, තවත් සමස්ත ආයතනයේ සමාන්තර ශ්‍රේණිවල නිලධාරීන්ටම අදළ බවට කළ වගඋත්තරකරුගේ යෝජනාව ඉල්ලුම්කරු ප්‍රතික්ෂේප කළේය.

මෙම ඉල්ලුම්කරුගේ ඉල්ලීම් ඉතාම අසාධාරණ බවත්, බේරුම්කරණයට පැමිණීමට පෙර එකී ඉල්ලීම් සම්බන්ධව වගඋත්තරකරු දනුවත් නොකල බවට වග උත්තරකරු ගෙනෙන ලද යෝජනාව තම ඉල්ලීම කෙරෙහි ප්‍රතිචාර නොදක්වීම අසාධාරණයක් බවත්, ලිඛිතව තම ගැටළු සම්බන්ධව තුන් වතාවක් ඉදිරිපත් කොට අවසානයේ බේරුම්කරණය වෙත ඉදිරිපත් කල බවත්, ඉල්ලුම්කරු පැහැදිලි කළේය.

වග උත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ පරිපාලන නිලධාරිනි එස්. ලියනගේ මහත්මිය සාක්ෂි දෙමින් ශ්‍රේණිගත උසස්වීම් සම්බන්ධව නිලධාරීන් 139 දෙනෙකු සම්බන්ධයෙන් කරුණු

විමසා නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් පතා ඇති බවත්, එකී ලිපිය ආර්/03 හා ආර්/03ඒ ලෙස සලකුණු කර සිටියාය. නිසි උපදෙස් ලද පසු මෙම ඉල්ලුම්කරුට ද යම් සේවයක් ලැබෙන බවත් සාක්ෂි දුන්නාය.

එකී සාක්ෂිකාරිය එනම්, වගඋත්තරකරුගේ පිරිස් සහ පාලන අංශයේ පරිපාලන නිලධාරි මහත්මිය හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් 2000 වර්ෂයේ සිට ඉල්ලුම්කරුට සිදුව ඇති අසාධාරණය සඳහා 2013.06.30 වැනි දින ලිපියෙන් නීතිපති උපදෙස් පතා සිටියත්, මෙම පරීක්ෂණය පවත්වන තෙක් නිසි පිළිතුරක් නොමැති බවත් පිළිගත්තාය.

තවද,

ප්‍ර : එතකොට ඒ ගැටළු ඇති කරල තිබෙන්නේ ඒවාට විසඳුම් ලබාදීල නැත්තේ සේවා යෝජක ආයතනයෙන් ද?

පි : පිළිතුරක් නැත.

ප්‍ර : ඉල්ලුම්කරුට ලැබිය යුතු ශ්‍රේණිගත උසස්වීම් නොලැබීම සම්බන්ධයෙන් ඉල්ලුම්කරු අධිකරණයේ පිහිට පතා තිබෙනවා වගේ වෙනත් සේවකයින් අධිකරණයේ පිහිට පතා තිබෙනවාද ? ඒ බව ඔබ දැනුවත් ද? ඒ බව ඔප්පු කරන්න ඔබ ළඟ ලේඛන තිබෙනවාද ?

පි : උත්තරයක් නැත.

ප්‍ර : ඒ අනුව එම වකවානුවලදී ඉල්ලුම්කරුට කාර්මික නිලධාරි 1 ශ්‍රේණිය හා කාර්මික නිලධාරි විශේෂ ශ්‍රේණියට උසස් නොකිරීම සම්බන්ධයෙන් පිළිගත් ලිඛිත කරුණු ඉදිරිපත් කරන්න ඔබට හැකියාවක් නෑ නේ ද?

පි : උත්තරයක් නැත (කාර්ය සටහන් 46 සහ 47)
කාර්ය සටහන 48 ....................
අධිකරණය :

ප්‍ර : නීතිපති දෙපාර්තමේන්තුවෙන් විමසා ඇත්තේ කුමක් සම්බන්ධයෙන් ද?

උ : මට පැහැදිලි කිරීමක් කරන්න බැහැ.

ප්‍ර : එම විමසීමට මෙම ඉල්ලුම්කරුගේ නම ඇතුළත් කර තිබෙනවාද ?

පි : කාර්මික නිලධාරි තනතුර පමණයි ඇතුළත් කලේ.

ප්‍ර : මේ සම්බන්ධව නීතිපතිගෙන් විමසීම ප්‍රයෝජනවත් වෙනවාද?

උ : උත්තරයක් නැත.

ප්‍ර : අධ්‍යක්ෂ මණ්ඩලයට මේ පිළිබඳව තීරණයක් ගැනීමට හැකියාවක් නැත්තේ ඇයි?

උ : මම මේ පිළිබඳව කියන්න දන්නේ නෑ. එන මොහොතේත් මේ ගැන සාකච්ඡා කලා.

යනුවෙන් වගඋත්තරකරුගේ සාක්ෂිකාරියගේ සාක්ෂියේදී මෙම ඉල්ලුම්කරුගේ ගැටළුව සම්බන්ධයෙන් දෙන ලද උත්තරවලින් හෙළිවනුයේ වග උත්තරකරු මෙම ගැටළුව විසඳීමට කිසියම් ප්‍රයත්නයක් නොදරා සිටින බවය.

විභාගය අවසානයේ දී දෙපාර්ශ්වයටම ලිඛිත දේශන ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් ලබාදෙන ලදී.

වග උත්තකරුගේ ලිඛිත දේශනය අනුව ඕනෑම පරිපාලන ආයතනයක් තුළ පරිපාලනමය කටයුතු කරගෙන යාමේ දී ක්ෂණිකව පරිපාලන තීරණ ගැනීමට සිදුවීම (Ad-hoc decisions) “විවිධ වූ අභ්‍යන්තරික චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීම මෙන්ම අනෙකුත් රාජ්‍ය චක්‍රලේඛ අප ආයතනයන්ට අනුගත කිරීමට කටයුතු කිරීමේ දී සිදු වන්නාවූ යම් යම් අපහසුතාවයන් පැන නැගීම ආයතනයකට අසාමාන්‍ය කරුණක් නොවේ.” යන අදහස ඉදිරිපත් කොට ඇත. තවදුරටත් “රාජ්‍ය ආයතනයන්ට තීරණ ගැනීමේදී අධ්‍යක්‍ෂ මණ්ඩලයට පමණක් තීරණ ගත නොහැකි කරුණු නීතිපති දෙපාර්තමේන්තුවෙන් විමසා ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට යොමු කිරීම සාමාන්‍ය තත්ත්වයයි.” යනුවෙන් ආයතනයේ කාර්මික නිලධාරීන්ගේ පොදු ප්‍රශ්නයක් පවත්නා බවත්, එම ප්‍රශ්නය විශේෂයෙන් මෙම ඉල්ලුම්කරුට අදළ ප්‍රශ්නය වර්ෂ 2000 සිට ආරම්භව ඇති වුවද, ආයතනයේ එවන් ප්‍රශ්න විසඳා ගැනීම සඳහා 2013.06.30 වැනි දින නීතිපති දෙපාර්තමේන්තුව විමසා සිටීම සම්බන්ධව ඉල්ලුම්කාර පාර්ශ්වය සෑහීමට පත් නොවන බැව් හෙළි කළේය. එසේම මෙයින් මෙම අයදුම්කරු බේරුම්කරණ අධිකරණ මාර්ගයක් ගැනීමට කැමැත්ත පළ කොට ඇත.

වගඋත්තරකාර පාර්ශ්වය 2014.12.10 වැනි දින කාර්ය සටහන් අනුව සමස්ථයක් සම්බන්ධව වගඋත්තරකාර පාර්ශ්වයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව දැනුම් දුන් අතර, එතුමා විසින් උපදෙස් දී ඇත්තේ විශේෂ ශ්‍රේණියට පත් වූ දින සිට ඉල්ලුම්කරුට හිඟ වැටුප් වශයෙන් රු. 28,226ක මුදලක් ගෙවා ඇති බැවින් මෙම සමථ යෝජනාව ගරු අධිකරණය විසින්ම නිවැරදි කර ඉදිරිපත් කරන්නේ නම් ඒ පිළිබඳ නැවත සලකා බැලිය හැකි බව වාර්තාගත කොට පවතී.

ඒ අනුව ඉල්ලුම්කරුගේ ලිඛිත දේශනය සමග ඉදිරිපත් කොට ඇති “x/01” සහ “x/02” යන ලේඛන ඉල්ලුම්කරු විසින්ම සකස් කොට බේරුම්කරණය වෙත ඉදිරිපත් කල ලේඛන වේ. ඒ අනුව එකී ලේඛන දෙක වගඋත්තරකරුගේ නිරීක්ෂණ සඳහා මෙම ප්‍රදානයේ කොටසක් ලෙස සලකා මේ සමග ඉදිරිපත් කරමි.

"X/01"

| කාල පරාසය | ලැබුණු මාසික වැටුප රු. | ලැබිය යුතු මාසික වැටුප රු. | මාසිකව හිඟ මුදල රු. | වර්ෂයකට වැටුප් හිඟ වැටුප් රු. | නිවාඩු දින (මාසික) හිඟ මුදල රු. | වර්ෂයකට නිවාඩු දින හිඟ මුදල රු. | මාසිකව 1/3 දීමනා හිඟ මුදල රු. | වර්ෂයකට 1/3 දීමනා හිඟ මුදල රු. |
|---|---|---|---|---|---|---|---|---|
| 2000.09.30 2001.09.29 | 8255.00 | 11635.00 | 3380.00 | 40560.00 | 169.00 | 2028.00 | - | - |
| 2001.09.30 2002.09.29 | 8460.00 | 11920.00 | 3460.00 | 41520.00 | 173.00 | 2076.00 | - | - |
| 2002.09.30 2003.09.29 | 8665.00 | 12205.00 | 3540.00 | 42480.00 | 177.00 | 2124.00 | - | - |
| 2003.09.30 2004.09.29 | 8870.00 | 12490.00 | 3620.00 | 43440.00 | 181.00 | 2172.00 | - | - |
| 2004.09.30 2005.09.29 | 9075.00 | 12775.00 | 3700.00 | 44440.00 | - | - | - | - |
| 2005.09.30 2006.09.29 | 9280.00 | 13060.00 | 3780.00 | 45360.00 | - | - | - | - |
| එකතුව | | | | 257760.00 | - | 8400.00 | - | - |

"X/02"

| කාල පරාසය | ලැබුණු මාසික වැටුප රු. | ලැබිය යුතු මාසික වැටුප රු. | මාසිකව හිඟ මුදල රු. | වර්ෂයකට වැටුප් හිඟ වැටුප් රු. | නිවාඩු දින (මාසික හිඟ මුදල රු. | වර්ෂයකට නිවාඩු දින හිඟ මුදල රු. | මාසිකව 1/3 දීමනා හිඟ මුදල රු. | වර්ෂයකට 1/3 දීමනා හිඟ මුදල රු. |
|---|---|---|---|---|---|---|---|---|
| 2006.09.30 2007.09.29 | 18598.50 | 26375.00 | 7776.50 | දෙසැම්බර් දක්වා රු. 11664.75 ජනවාරි සිට 69988.50 | - | - | - | - |
| 2007.09.30 2008.09.29 | 21400.00 | 26925.00 | 5525.00 | 66300.00 | 276.25 | 1657.50 | 1841.66 | 11050.00 |
| 2008.09.30 2009.09.29 | 21715.00 | 27475.00 | 5760.00 | 69120.00 | 288.00 | 6912.00 | 1920.00 | 23040.00 |
| 2009.09.30 2010.09.29 | 22030.00 | 28025.00 | 5995.00 | 71940.00 | 299.75 | 7194.00 | 1998.33 | 23980.00 |

"x/02" (සම්බන්ධිතයි)

| කාල පරාසය | ලැබුණු මාසික වැටුප රු. | ලැබිය යුතු මාසික වැටුප රු. | මාසිකව හිඟ මුදල රු. | වර්ෂයකට වැටුප් හිඟ වැටුප් රු. | නිවාඩු දින (මාසික හිඟ මුදල රු. | වර්ෂයකට නිවාඩු දින හිඟ මුදල රු. | මාසිකව 1/3 දීමනා හිඟ මුදල රු. | වර්ෂයකට 1/3 දීමනා හිඟ මුදල රු. |
|---|---|---|---|---|---|---|---|---|
| 2010.09.30 2011.09.29 | 22345.00 | 28575.00 | 6230.00 | 74760.00 | 311.50 | 7476.00 | 2076.66 | 24919.92 |
| 2011.09.30 2012.09.29 | 22660.00 | 29125.00 | 6465.00 | 77580.00 | 323.25 | 3879.00 | 2586.00 | 31032.00 |
| 2012.09.30 2013.09.29 | 26375.00 | 29675.00 | 3300.00 | 39600.00 | 165.00 | 1980.00 | 1100.00 | 13200.00 |
| 2013.09.30 2014.09.29 | 26925.00 | 30225.00 | 3300.00 | 39600.00 | 165.00 | 1980.00 | 1100.00 | 13200.00 |
| එකතුව | | | | 520552.50 | - | 31078.50 | - | 140421.92 |

යොමුවේ සඳහන්,

(i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්මික නිලධාරි I වන ශ්‍රේණියේ සේවය කරන ඒ. එම්. එන්. ඒ. ඩී. රෝහිත ප්‍රේමලාල් මහතාව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 2000.09.30 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි කාර්මික නිලධාරි 1 වන ශ්‍රේණියට උසස් නොකිරීම යුක්ති සහගත නොවන බැව් මෙතෙක් දීර්ඝ වශයෙන් සඳහන් කරන ලද විභාග විස්තරය අනුව තීරණය කරමි.

(ii) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ඒ. එම්. එන්. ඒ. ඩී. රෝහිත ප්‍රේමලාල් මහතාට 2006 වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි කාර්මික නිලධාරි විශේෂ ශ්‍රේණිය ලබා නොදීම යුක්ති සහගත නොවන බවද තවදුරටත් නිගමනය කරමි.

එසේ හෙයින් ඔහුට හිමිවිය යුතු සහන පහත සඳහන් පරිදිවේ.

ඉල්ලුම්කරු පළමු ශ්‍රේණියේ කාර්මික නිලධාරි තනතුර සඳහා උසස්වීමට 2000.09.30 වෙනි දිනය වන විට අවශ්‍ය සුදුසුකම් සපුරා තිබූ නමුත් එම උසස්වීම තමාට ලබා දී ඇත්තේ 2005.09.30 වෙනි දින එනම්, වර්ෂ 05කට පසුව බවත් තමා විශේෂ ශ්‍රේණියේ කාර්මික නිලධාරි තනතුර 2006.09.30 වැනි දින එනම් වසර 05ක් ඉක්ම ගිය තැන්හි ලබාදී ඇති හෙයින් ද මෙම වගඋත්තරකාර පාර්ශ්වය ඉල්ලුම්කරුට මානසික හා ආර්ථික අගතියක් සිදු කොට ඇති බවත් පිළිගත හැක.

මේ අනුව යොමුවේ පළවන විසඳිය යුතු ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් එකී පැනය පැවතීම හේතු කොට ඉල්ලුම්කරු විසින් සකස් කරන ලද "X/01"ලේඛනයෙහි සඳහන් මුදල් ප්‍රමාණයන් ඉල්ලුම්කරු වෙත ගෙවීමට ද,

දෙවන පැනයට පිළිතුරු වශයෙන් ඉල්ලුම්කරුට සිදුව ඇති අගතිය සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් සකස් කරන ලද "x/02" ලේඛනයෙහි සඳහන් මුදල වගඋත්තරකරුගේ විමර්ශනයට ලක් කොට මෙම ප්‍රදනය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී එක් මසක් ඇතුළත ගෙවා නිම කිරීමට නියෝග කරමි.

මෙම ප්‍රදනය සාධාරණ හා යුක්තිසහගත බව සහතික කරමි.

එස්. කාරියවසම්,
කාර්මික අධිකරණයේ බේරුම්කරණ
මණ්ඩලයේ සාමාජික.

2015 මාර්තු මස 31 වැනි දින,

08-129

---

මගේ අංකය : IR/10/24/2011

## කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.05.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හාලිඇල, ජයතිලක මාවත, අංක 44 හි පදිංචි ආර්. ඩී. ධනපාල මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, අංක 50 හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව,

බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2015.03.12 දිනැති ප්‍රදනය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2015 ජූලි මස 07 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/10/24/2011

කාර්මික අධිකරණයේ දී ය.

ආර්. ඩී. ධනපාල මහතා,
අංක 44, ජයතිලක මාවත,
හාලිඇල.

- පළමු පාර්ශ්වය-

එරෙහිව

නඩු අංකය : ඒ/3452

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

- දෙවන පාර්ශ්වය-

ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් 2012.05.10 වෙනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ :-

"ලංකා විදුලිබල මණ්ලයේ සේවය කල ආර්. ඩී. ධනපාල මහතා 2002.07.04 වෙනි දින පැවැත්වූ ගබඩා භාරකරුවන් පළමු පන්තියට උසස් කිරීමේ පරීක්ෂණයේ ප්‍රතිඵල මත පළමු ශ්‍රේණියේ නොපිහිටුවීමෙන් ඔහුට යම් අගතියක් සිදුවුයේ ද, එසේවූයේ නම් කුමන සහනයන් ඔහුට හිමි විය යුතු ද යන්නත් පිළිබඳව වේ."

දෙපාර්ශ්වය සිය ප්‍රකාශ ගොනු කිරීමෙන් අනතුරුව සමථයක් දෙපාර්ශ්වය අතර ඇති නොවීමෙන් මෙම ආරවුල විභාගයට ගන්නා ලදී. පළමු පාර්ශ්වය හෙවත් ඉල්ලුම්කරු මෙම ආරවුලට අදළ සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සිය සාක්ෂි මෙහෙයවීම අවසන් කොට අවසානයේ දී ලකුණු කරන ලද පැ/01 සිට පැ/27 දක්වා ලේඛන සමග ලිඛිත සැලකිරීම් බේරුම්කරණයට භාර දෙන ලදී.

දෙවන පාර්ශ්වය හෙවත් වගඋත්තරකරු සිය සාක්ෂි මෙහෙයවීම ආරම්භ කරමින් ගණකාධිකාරිනි සමෝෂි විමර්ෂණී, ප්‍රධාන ඉංජිනේරු යූ. එන්. අත්තනායක, මානව සම්පත් නිලධාරිනි ඩබ්. ඩී. ආර්. ඉෂානි පෙරේරා සාක්ෂියට කැඳවීමෙන් අනතුරුව සාක්ෂි මෙහෙයවීම අවසන් කොට ලකුණු කරන ලද ආර්/01 සිට ආර්/18 සමග ලිඛිත සැලකිරීම් බේරුම්කරණයට භාර දෙන ලදී.

ඉල්ලුම්කරු III පන්තියේ ගබඩා භාරකරුවෙකු ලෙස 1985.12.16 වෙනි දින සිට සේවයට බැඳී 1996.09.23 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි II පන්තියේ "ආ" බණ්ඩයට උසස්වීම් ලබා තිබූ බව පැ/01 හා පැ/02 අනුව හා සේවා යෝජක ඉදිරිපත් කල සාක්ෂි අනුව පිළිගත හැකිය. ඉන් අනතුරුව ගබඩා භාරකරු I වන පන්තියට උසස් කිරීම සඳහා වූ 2001 සීමිත තරග විභාගයෙන් ඉල්ලුම්කරු සමත්ව තිබූ බව 2002.10.01 වෙනි දින දරන පැ/03 ලේඛනයේ දක්වේ.

මෙම විභාගය සමත් වුවද, එම තනතුර ඉල්ලුම්කරුට ලැබී නැති බව දෙපාර්ශ්වයම ඉදිරිපත් කළ සාක්ෂි අනුව අනාවරණය විය.

මෙම ඉල්ලුම්කරු ඉහත විභාගය සමත් වී තිබිය දී අල්ලස් හා දූෂණ චෝදනාවක් මත අත්අඩංගුවට ගෙන තිබෙන බවද, ඒ අනුව ඉල්ලුම්කරු 2002.11.11 වැනි දින සිට සේවය අත්හිටුවා තිබෙන බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව අනාවරණය විය. ඉහත චෝදනාවලින් ඉල්ලුම්කරු නිදෙස් කොට නිදහස් කිරීම මත නැවත සේවයේ පිහිටුවා තිබෙන බවද, 2002.11.11 වෙනි දින සිට හිඟ වැටුප් සහිතව නැවත සේවයේ පිහිටුවා තිබූ බව 2007.06.28 වෙනි දින දරන පැ/04 ලේඛනයෙන් මෙන්ම වගඋත්තරකරු සඳහන් කරුණු අනුව තහවුරු විය.

ඉල්ලුම්කරු බේරුම්කරණයට කරුණු ඉදිරිපත් කරමින් කියා සිටියේ තමාට හිඟ වැටුප් සමග රැකියාව ලැබුණත්, I වැනි ශ්‍රේණියට උසස්වීමේ විභාගය සමත්ව තිබියදී එකී තනතුර තමන්ට ඉහත වගඋත්තරකරු විසින් ලබා නොදුන් බවය. ඒ පිළිබඳව ඉල්ලීම් කල බවද, ඒ අනුව නොලැබීම මත මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කල බවද, ඒ අනුවද ඉහත තනතුර නොලැබුණු බවට ඉල්ලුම්කරු පැ/08 ලේඛනය ඉදිරිපත් කරමින් බේරුම්කරණයට සාක්ෂි ඉදිරිපත් කර තිබිණ. ඉහත මානව හිමිකම් කොමිෂන් සභාව 2009.12.21 වැනි දිනෙන් යුතුව ලබා දෙන ලද වාර්තාවේ පිටපතක් පැ/08 වශයෙන් ලකුණු කොට ඉල්ලුම්කරු බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ.

වගඋත්තරකරු ඉල්ලුම්කරුට 2010.03.03 වෙනි දින දරන පැ/09 වශයෙන් ලකුණු කරන ලද ලිපිය නිකුත් කරමින් I වැනි පන්තියට උසස් කිරීමට අදාළව පුහුණු අවශ්‍යතාවය සපුරා නොමැති බැවින් ඉහත තනතුර ලබා දිය නොහැකි බව දනුම් දී තිබූ බව ඉහත ලේඛනය අනුව අනාවරණය වේ.

ඉල්ලුම්කරුට I වෙනි ශ්‍රේණියේ ගබඩා භාරකාර තනතුර නොලැබීම මත කම්කරු කොමසාරිස්ට පැමිණිලි කර ඇති අතර, ඒ අනුව පරීක්ෂණයක් පවත්වා ඉල්ලුම්කරු ඉල්ලා ඇති පරිදි පළමු ශ්‍රේණියේ පිහිටුවන ලෙස වගඋත්තරකරුට දැනුම් දී තිබෙන බව පැ/10, පැ/11 වශයෙන් බේරුම්කරණයේ ලකුණු කරන ලද කම්කරු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ලිපි අනුව අනාවරණය වේ.

වගඋත්තරකරු විසින් සිය කරුණු ඉදිරපත් කරමින් ඉල්ලුම්කරු I වෙනි ශ්‍රේණියේ ගබඩා භාරකාර තනතුර ලබා ගැනීම සඳහා සුදුසුකම් සපුරා නැති බැවින් ඉහත තනතුර ලබා නොදුන් බවට බේරුම්කරණයේ කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර තිබිණ.

ඉල්ලුම්කරු I වැනි ශ්‍රේණියේ ගබඩා භාරකාර තනතුර සඳහා විභාගය සමත්වීම පිළිබඳව ඉල්ලුම්කරුට දැනුම් දී ඇත්තේ 2002.10.01 වෙනි දින දරන පැ/03 ලේඛනය මගිනි. ඉහත දිනයෙන් පසුව 2002.11.11 වෙනි දින සිට ඉල්ලුම්කරුගේ සේවය තහනම් කර ඇති අතර, ඒ අනුව ඉල්ලුම්කරුට සිය පුහුණු අවශ්‍යතාවය ලබා ගැනීමට අවස්ථාවක් ලැබී නැති බව පිළිගතහැකිය. විභාගය සමත් වීමෙන් අනතුරුව ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කිරීමට පෙර අවශ්‍ය පුහුණුව විභාගය සමත් වූ කිසිදු සේවකයෙකුට ලබා දී තිබූ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත්ව නොතිබුණි. ඒ අනුව ඉහත විභාගය සමත් වූ සේවකයින්ට ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කරන ලද කාලය තුළ ඉහත පුහුණුව ලබා දී තිබෙන බව පිළිගත හැකිය.

ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කර ඇත්තේ අල්ලස් චෝදනාවක් මතය. ඉහත චෝදනාවෙන් ඉල්ලුම්කරු නිදෙස් කොට නිදහස් කර තිබීම මත ඉල්ලුම්කරු නිර්දෝෂී පුද්ගලයෙකු වන හෙයින් ඉල්ලුම්කරුට හිඟ වැටුප් සමග නැවත රැකියාව වැටුප් වර්ධක සමග ලැබී තිබෙන බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරු විය.

ඉල්ලුම්කරු සිය සාක්ෂියේ දී 2007.07.03 වෙනි දින සේවයට වාර්තා කල බව සඳහන් කර තිබිණ. ඔහුගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත 2008.09.21 වෙනි දින සිට විශ්‍රාම ගිය බව ඉල්ලුම්කරු සඳහන් කළ අතර, එම කරුණු අභියෝගයට ලක් නොවුණි.

2007.07.03 වෙනි දින සිට 2008.09.21 වෙනි දින දක්වා කාලය තුළ සේවා යෝජක ඉල්ලුම්කරුට I වෙනි ශ්‍රේණිය ලබා දීමට අවශ්‍ය පුහුණුව ලබා දීමට පියවරක් ගෙන නොතිබූ බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය. ඉහත ආකාරයේ පුහුණුවක් ලබා දීමේ වගකීම ඇත්තේ සේවා යෝජකට වන අතර, මෙම ඇති වූ විශේෂ තත්ත්වය සැලකිල්ලට ගෙන ඒ සම්බන්ධයෙන් පියවර ගෙන නොමැති බවද බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය. වගඋත්තරකරුට අදළ කාලය තුළ ඉහත පුහුණුව ලබා නොදීමට විශේෂ හේතුවක් තිබූ බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් ව නොතිබුණි.

දෙවන පාර්ශ්වය වන සේවා යෝජක ඉහත පුහුණුව නොතිබීම මත ඉල්ලුම්කරුට I වෙනි ශ්‍රේණිය ලබා දිය නොහැකි බව කම්කරු දෙපාර්තමේන්තුවට දැනුම් දී තිබෙන බවද, එසේම ඉල්ලුම්කරුට ද ඒ පිළිබඳව දැනුම් දී තිබූ බව බේරුම්කරණයේ දී සනාථ විය. වගඋත්තරකරු ඉල්ලුම්කරුට යවන ලද 2010.03.03 වෙනි දින දරන පැ/09 ලේඛනය හා කම්කරු දෙපාර්තමේන්තුවේ දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය විසින් යවන ලද 2010.08.11 වෙනි දින දරන පැ/10 දරන ලේඛනය මගින් ඉහත කරුණු තහවුරු වේ.

දෙවන පාර්ශ්වය වන සේවා යෝජක බේරුම්කරණයට සාක්ෂි ඉදිරිපත් කරමින් ඉල්ලුම්කරු සේවය කල කාලය තුළ දී විෂමතාවන් සිදු කර තිබෙන බවද, ඊට වගකිව යුතු වීම මත මෙම උසස්වීම ලබා ගැනීමට ඔහුට හැකියාවක් නොමැති බවට කරුණු ඉදිරිපත් කර තිබිණ.

ඉල්ලුම්කරු දියතලාව ප්‍රාදේශීය කාර්යාලයට අනුයුක්තව සේවය කරමින් සිටියදී 1997.12.19 වෙනි දින සිට 1997.12.20 වෙනි දින දක්වා බදුල්ල නර්සිං හෝම් සාත්තු නිවාසයේ සිය භාර්යාව රෝහල්ගත කල බවට අසත්‍ය ප්‍රකාශයක් කරමින් රු. 10055 ක් ප්‍රතිපූර්ණය කරවා ගැනීම සම්බන්ධයෙන් ඉල්ලුම්කරුට එරෙහිව චෝදනා නගා තිබෙන බව වගඋත්තරකරු බේරුම්කරණයට සාක්ෂි ඉදිරිපත් කරමින් සඳහන් කර තිබිණ.

ඉහත චෝදනා පත්‍රය ලබා දී ඇත්තේ 1999.12.30 වෙනි දින වන අතර, එම චෝදනා පත්‍රයේ පිටපතක් වගඋත්තරකරු ආර්/02 වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ.

ඉහත චෝදනා පත්‍රය නිකුත් කිරීමෙන් අනතුරුව එම වරද ඉල්ලුම්කරු ලිඛිතව පිළිගැනීම මත විනය පරීක්ෂණයක් නොපවත්වා ඉල්ලුම්කරුට දඬුවම් කල බව වගඋත්තරකරුගේ ස්ථාවරය විය. ඉල්ලුම්කරු වරද ලිඛිතව පිළිනොගත් බව සඳහන් කල අතර, ඉල්ලුම්කරු ඉදිරිපත් කල වරද පිළිගත් බවට අදළ ලිපිය බේරුම්කරණයට ඉදිරිපත් කිරීමට වගඋත්තරකරු අපොහොසත් විය. එම ලේඛනය වගඋත්තරකරු භාරයේ තිබිය යුතු ලේඛනයක් බවද පිළිගත යුතුය. ඉහත මුදල අඩු කර ගත් බව ඉල්ලුම්කරු ද සිය සාක්ෂියේ දී පිළිගෙන තිබිණ. ඉල්ලුම්කරු ඉහත වගඋත්තරකරු සඳහන් කළ ලිපිය නොදුන් බව සඳහන් කලද ඉහත මුදල පඩියෙන් අඩු කර ගැනීම සම්බන්ධව විරෝධතාවයක් ද දක්වා තිබූ බවට කරුණු බේරුම්කරණයට ඉදිරිපත් නොවුනි. 2001.05.14 වෙනි දින දරන ආර්/03 ලිපිය මගින් ඉල්ලුම්කරුගේ විනය පරීක්ෂණය අත්හිටුවන බව දැනුම් දී තිබූ බව පිළිගත හැකිය.

ඉහත චෝදනාව මත ඉල්ලුම්කරුට වෛද්‍යාධාර ක්‍රමය යටතේ අනුග්‍රහය වසර 05ක් අහිමිකර තිබෙන බවද, ආර්/05 ලේඛනයේ සඳහන් කරුණු අනුව අනාවරණයවේ. එසේම ඉල්ලුම්කරුට වැටුප් වර්ධකයක් අහිමි කරන බවද , ඉහත ලේඛනය මගින් දැනුම් දී ඇත. චෝදනා පත්‍රයක් ලබා දී විනය පරීක්ෂණයක් නොපවත්නා වගඋත්තරකාර පාර්ශ්වය මෙම දඬුවම් ලබා දී තිබෙන බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව අනාවරණය විය.

ආර්/01 වශයෙන් සේවකයින්ට උසස්වීම්වලට බලපාන චක්‍රලේඛනයක් වග උත්තරකරු බේරුම්කරණයට ඉදිරිපත් කර තිබූ අතර, ඒ අනුව උසස්වීම් ලබා ගැනීමේදී දඬුවම් ලබාදීම සැලකිල්ලට ලක් කරන බවද, ඉහත චක්‍රලේඛනයේ දැක්වේ. මෙකී චක්‍ර ලේඛනය 1989.01.04 වෙනි දින නිකුත් කර ඇති අතර, ඉහත චක්‍රලේඛනය මෙම සිද්ධිය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුට බලපැවැත්වෙන බවට ආර්/05 ලිපියේ සඳහන් කිරීමක්ද කර නැත. චෝදනා පත්‍රයක් ලබා දී, විනය පරීක්ෂණයක් නොපවත්වා දඬුවම් ලබාදීමේදී ඉහත

චක්‍රලේඛනය කෙරෙහි අවධානයක් යොමු කිරීම ද වැදගත් වේ. එවැනි විටක ඉල්ලුම්කරුට ඒ සම්බන්ධයෙන් යම් පියවරක් ගැනීමේ හැකියාවක් තිබෙන බවද, ඉහත පරිදි දඬුවම් ලබාදීම ඉල්ලුම්කරු ඇතුළු සේවකයින් සංඛ්‍යාවකට ලබාදී තිබූ බව දෙපාර්ශ්වයම ඉදිරිපත් කල කරුණු අනුව අනාවරණය විය. ඉහත සේවකයින්ට මෙම දඬුවම නියම කර ඇත්තේ ඉහළ කළමනාකාරිත්වය විධිමත් පරීක්ෂණයකින් තොරව බවද, ඒ අනුව මෙවැනි දඬුවමක් ලබාදීම එය උසස්වීමක් ලබාදීමේදී සැලකිල්ලට ගැනීමත් සාධාරණ හා යුක්ති සහගත නොවන බව පිළිගත හැකිය.

ඉල්ලුම්කරුට ඉහත ආර්/05 පරිදි වැටුප් වර්ධකයක් අත්හිටුවා තිබූ බවටද, නිශ්චිතව සාක්ෂි බේරුම්කරණයට ඉදිරිපත් නොවුණි.

ඉල්ලුම්කරු මෙම ගබඩා භාරකරුවන්ගේ 1 වෙනි ශ්‍රේණියට අයදුම්පත් ඉදිරිපත් කර ඇත්තේ වගඋත්තරකරු යටතේ සේවය කරමින් සිටියදීය. එවැනි නුසුදුසුකමක් තිබූ විටක, අදළ අයදුම්පත් නිර්දේශ කිරීමේදී එය සලකා බැලිය යුතුය. මෙම විභාගය 2002.07.14 වෙනි දින පවත්වා ඇති අතර, එම විභාගයේ ප්‍රතිඵල 2002.10.01 වෙනි දින නිකුත් කර තිබෙන බව පැ/03 ලේඛනය අනුව පිළිගත හැකිය. ඉල්ලුම්කරුගේ සුදුසුකම් සපුරාලීම හේතු කොට ගෙන ඉහත විභාගයට පෙනී සිටීමට ඉඩ ලබා දී තිබෙන බව අදළ විභාගයට පෙනී සිටීම තුළින්ම පිළිගත හැකිය.

ඉල්ලුම්කරු 1 වෙනි ශ්‍රේණියේ තනතුර ඉල්ලූ ප්‍රථම අවස්ථාවේදී ඉහත ස්ථාවරය වගඋත්තකරු ගෙන නැති බවද, බේරුම්කරණයට ඉදිරිපත් වූ පැ/10 හා පැ/11 දරන ලේඛන මගින් ද අනාවරණය වේ.

ඉහත ඉදිරිපත් වූ කරුණු අනුව ඉල්ලුම්කරුට නගන ලද ඉහත චෝදනාව පදනම්ව උසස්වීම ලබා නොදීම සාධාරණ හා යුක්තිසහගත නොවන බව පිළිගත හැකිය.

ඉල්ලුම්කරුව 2002.11.11 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි වැඩ තහනම් කර ඇත. එසේ වැඩ තහනම් කර ඇත්තේ අල්ලස් දූෂණ චෝදනාවක් යටතේ අත්අඩංගුවට ගැනීම හේතුකොට ගෙනය. ඉල්ලුම්කරු ගබඩා භාරකරුවෙකු වූ බැවින් ඔහු යටතේ භාණ්ඩ තොග තිබෙන බවද, ඒ අනුව හදිසියේ ඇති වූ ඉහත සිද්ධිය මත ඔහුට සිය භාරයේ තිබූ භාණ්ඩ භෞතිකව භාර දීමට නොහැකි වී තිබෙන බවද, පිළිගත හැකිය.

ඉල්ලුම්කරු නොමැතිව වගඋත්තරකරු තොග සමීක්ෂණයක් කර ඇති අතර, එහිදී තොගයේ අඩුවීම් හා අතිරික්ත තොග තිබූ බවට බේරුම්කරුණයට සාක්ෂි ඉදිරිපත් විය. “2003 තොග සමීක්ෂණය - පළාත් ගබඩාව හාලිඇල (එෆ් අංශය) ගබඩා භාරකරු - අමිත වීරතුංග - ඌණතා හා අතිරික්ත සම්බන්ධ කමිටු වාර්තාව” ආර්/07 වශයෙන් බේරුම්කරණයට ඉදිරිපත් කර තිබූ අතර, එම වාර්තාවේ කමිටු සාමාජිකයින් අත්සන් කර ඇත්තේ 2005.02.14 හා 2005.02.15 යන දිනවල බව ඉහත ලේඛනය නිරීක්ෂණය කිරීමේ දී අනාවරණය වේ.

ඉහත තොග පරීක්ෂාවට අමතරව තවත් තොග පරීක්ෂණ වාර්තාවක් ආර්/15 වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට වගඋත්තරකරු ඉදිරිපත් කර ඇත. මෙම තොග වාර්තාවේ දිනය 2007.12.31 වෙනි දින වශයෙන් සඳහන්ව ඇත. ඉහත තොග වාර්තාව පරිදි ඉල්ලුම්කරුගේ තොග ඌණතාවය රු. 353725.00 ක් බව ඉහත වාර්තාවේ සඳහන්ව ඇත.

ඉල්ලුම්කරුට නගන ලද අල්ලස් චෝදනාවෙන් ඉල්ලුම්කරු නිදොස්වීම මත ඉල්ලුම්කරුට හිඟ වැටුප් සමග රැකියාව ලබා දී ඇත. ඒ අනුව රු. 1239843.29 ක මුදලක් හිඟ වැටුප් වශයෙන් ගෙවා ඇත. ඉල්ලුම්කරුගෙන් අයවිය යුතු තොග ඌණතාවය වගඋත්තරකරු අඩු කිරීමෙන් අනතුරුව ඉතිරිය ඉල්ලුම්කරුට ගෙවා ඇති අතර, ඉල්ලුම්කරු විටින් විට කරන ලද අභියාචනා පදනම් කරගනිමින් විටින් විට ඉහත රඳවාගත් මුදලින් නැවත ගෙවීම් කර තිබෙන බවද බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.

ඉල්ලුම්කරුට ලබා දී ඇති 2009.08.17 වෙනි දින දරන ආර්/12 දරන ලිපිය පරිදි රු. 86772.50 වටිනාකමෙන් ඇති ඌණතාවයක් ද, එසේම ඊට 25% මාණ්ඩලික ගාස්තුවක් ද අයකර තිබෙන බව ආර්/12 හා ආර්/13 ලේඛන අනුව අනාවරණය වේ.

ඉල්ලුම්කරු සිය තොග ගණනය කිරීම නිසි පරිදි සිදු කර නැති බව ප්‍රකාශ කර තිබියදීත්, ඌණතාවයන්ට අදළව චෝදනා පත්‍රයක් ලබාදී ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් නොකොට ඉල්ලුම්කරුගේ හේතු දක්වීම මත පදනම්ව තොගවල ඌණතාවය වෙනස් කර තිබෙන බවද, බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව අනාවරණය විය. 2009.08.17 වෙනි දින දරන ආර්/12 ලිපිය අනුව ඉල්ලුම්කරුට වයස අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම ගොස් තිබෙන හෙයින් සානුකම්පිතව සලකා බැලීමෙන් අනතුරුව රු. 347090/= ක මුදලින් 75%ක් කපා හැර 25% ක ප්‍රමාණයක් අයකර ගැනීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිට පියවරක් ගෙන තිබෙන බවද, එම නිලධාරීන්ට එවැනි හැකියාවක් තිබේද යන්න ද ගැටලුවකි. එවැනි කපා හැරීමට තුඩුදුන් කරුණු බේරුම්කරණයට ඉහත නිලධාරීන් කැඳවා සාක්ෂි මගින් තහවුරු කිරීමට ද වගඋත්තරකරු අපොහොසත් විය.

ඉල්ලුම්කරුගේ සන්තකයේ තිබූ තොගයේ ඌණතාවයක් තිබුණේ නම් එය බරපතල විෂමාචාරයකි. ඒ අනුව චෝදනා පත්‍රයක් ලබාදී, ඒ අනුව කටයුතු කිරීමේ වගකීම සේවා යෝජක වෙත තිබෙන බවද, බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.

ඉහත සඳහන් සියලුම කරුණු සැලකිල්ලට ගැනීමේදී ඉල්ලුම්කරුට 1 වෙනි ශ්‍රේණියේ ගබඩා භාරකාර තනතුරු සඳහා විභාගය සමත් වීමෙන් පසුව එය ලබා නොදීමෙන් ඉල්ලුම්කරුට අගතියක් සිදුව තිබෙන බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරුව ඇති බව මම නිගමනය කරමි.

ඉල්ලුම්කරු 1 වෙනි ශ්‍රේණියට අදළ වැටුප් පිළිබඳව සාක්ෂි ඉදිරිපත් කර ඇතත්, වගඋත්තරකරු මගින් එහි නිරවද්‍යතාවය බේරුම්කරණයේ දී තහවුරු කොට නැත. ඉල්ලුම්කරු හැරුණු විට තවත් 11 දෙනෙක් ඉහත විභාගය සමත්ව තිබූ බව පැ/03 ලේඛනය අනුව අනාවරණය වේ. ඉහත නිලධාරීන් කුමන දිනයක සිට 1 වෙනි ශ්‍රේණියට පත් කලේද යන්න පිළිබඳව තොරතුරු බේරුම්කරණයට ඉදිරිපත් නොවුණි.

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන ඉල්ලුම්කරුට 1 වෙනි ශ්‍රේණියේ ගබඩා භාරකාර තනතුර හිමිවිය යුතු දිනයේ සිට පත් කොට ඊට අදළ වැටුප් තලයේ පිහිටුවා ඒ අනුව ඉල්ලුම්කරු විශ්‍රාම ගිය දිනය වන 2008.09.21 වෙනි දින දක්වා හිඟ වැටුප් ගෙවන ලෙසත්, ඊට අමතරව විශ්‍රාම වැටුප ඉහත වැටුප් පදනම් කොට

ගණනය කර ලබාදෙන ලෙසත්, මේ දක්වා ඊට අදළ හිඟ විශ්‍රාම වැටුපත් ගෙවන ලෙසත්, එය ලබාදීම සාධාරණ හා යුක්තිසහගත බව මම නිගමනය කරමි.

ඉහත සඳහන් සහන මුල්‍යමය හිමිකම් මෙම ප්‍රදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික *සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළකර මසක් ඇතුළත ඉල්ලුම්කරුට ගෙවන ලෙසත්, ලංකා විදුලිබල මණ්ඩලයට මෙයින් නියෝග කරමි.

මෙම මුදල් වගඋත්තරකරු භාරයේ තිබෙන ලිපි ලේඛන අනුව නිවැරදි ලෙස ගණන් බලා කම්කරු කොමසාරිස් මගින් ඉල්ලුම්කරුට ගෙවන ලෙසද වගඋත්තරකාර මණ්ඩලයට නියෝග කරනු ලැබේ.

පාලිත වීරසේකර,
බේරුම්කරු.

දිනය : 2015 මාර්තු මස 12 වැනි දින,

08-130

---

මගේ අංකය : IR/15/42/2010

### කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.08.30 දිනැති හා අංක 1773/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2012.08.09 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රජවැල්ල, දිගන නිලගම, අංක 226 හි පදිංචි චන්ද්‍රා හේවගේ මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2015.02.26 දිනැති සංශෝධිත ප්‍රදනය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2015 ජූනි මස 26 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

චන්ද්‍රා හේවගේ,
අංක 226,
දිගන, නිලගම,
රජවැල්ල.

- ඉල්ලුම්කාරිය-

නඩු අංකය : ඒ/3472

-එදිරිව-
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක : 500, ටී, බී. ජයා මාවත,
කොළඹ 10.

- වගඋත්තරකරු-

අතර ඇති පවත්නා කාර්මික
ආරවුල සම්බන්ධවයි.

### සංශෝධිත තීන්දුව හා ප්‍රදනය

උක්ත ආරවුල සම්බන්ධයෙන් වූ මගේ 2014.08.18 වන දින දරන තීන්දුව හා ප්‍රදනය පහත පරිදි සංශෝධනය විය යුතු බවට මෙයින් නියෝග කරමි. එකී නියෝගයේ සඳහන් 33,34,35,36 හා 37 යන වගන්ති පහත පරිදි සංශෝධනය විය යුතුය.

33. මෙම නඩුව සඳහා වගඋත්තරකාර අධිකාරිය විසින් ගොනු කර ඇති පළමු ප්‍රකාශයේ ඉහත කී වැටුප් වර්ධකය ගෙවීමේදී හිඟ වැටුප් වශයෙන් ඉල්ලුම්කාරියට රු. 25,572.16ක මුදලක් ගෙවා ඇති බවත්,

34. එකී මුදල ආපසු අය කර ගැනීම මෙම නඩුවට හේතු වී ඇති බැවින් එසේ ආපසු අය කරගත් මුදල වන රු. 25,572.16ක මුදල ඉල්ලුම්කාරියට මෙම නඩුවේ වගඋත්තරකාර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ආපසු ගෙවිය යුතු බවට මෙයින් නියෝග කරමි.

35. තව ද එකී රු. 25,572.16ක මුදල මෙම සංශෝධිත තීන්දුව හා ප්‍රදනය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු එක් මසක් ඇතුලත සහකාර කම්කරු කොමසාරිස් (මැද කොළඹ ) වෙත තැන්පත් කළ යුතු බවට ද වගඋත්තරකාර ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට මෙයින් නියෝග කරමි. එයින් පසු එකී මුදල් ඉල්ලුම්කාරියට ලබාගත හැකි බවටද මෙයින් නියෝග කරමි.

36. ඊට අතිරේකව ඉල්ලුම්කාරිය මෙන්ම වගඋත්තරකාර අධිකාරිය ද නඩු විභාගයේ දී ඉදිරිපත් කල වගඋත්තරකාර අධිකාරියේ අංක MA/ADM/PF/978 හා 2006.06.26 දිනැති ලිපියේ දක්වෙන පරිදි 2000.11.27 දිනට නියමිත අදල වැටුප් වර්ධකය ඉල්ලුම්කාරියට ලබා දිය යුතු ලෙසට ද, අනතුරුව නියමිත පරිදි වැටුප් වර්ධකයන් ලබාදිය යුතු ලෙසට ද, ඒ අනුව එකී වැටුප් වර්ධකවල යම් හිඟ මුදලක් වේ නම් එකී මුදල් ඉල්ලුම්කාරියට ගෙවිය යුතු බවට ද, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට වැඩිදුරටත් මෙයින් නියෝග කරමි. මෙකී මුදල් මෙම සංශෝධිත තීන්දුවේ හා ප්‍රදනයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසු එක් මසක් ඇතුලත

ඉල්ලුම්කාරියට ගෙවිය යුතු බවටද ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට මෙයින් නියෝග කරමි.

37. තවද මෙම ආපසු අයකිරීම නිසා ඉල්ලුම්කාරියගේ සේවක අර්ථ සාධක අරමුදලේ දයක මුදල් අඩුවෙන් ගෙවා ඇත්නම් එසේ අඩුවෙන් ගෙවන ලද මුදලද එකී සේවක අර්ථ සාධක අරමුදල වෙත බැර කළ යුතු බවට ද වගඋත්තරකාර ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට මෙයින් වැඩිදුරටත් නියෝග කරමි. මෙම දයක මුදල් මෙම සංශෝධිත තීන්දුව හා ප්‍රදනය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු එක් මසක් ඇතුලත එකී සේවක අර්ථ සාධක අරමුදල සඳහා බැර කළ යුතු බවටද මෙයින් නියෝග කරමි.

පී. දනන්සූරිය,
බේරුම්කරු.

වර්ෂ 2015 ක් වූ පෙබරවාරි මස 26 වැනි දින දී ය.

08-131